# STUDENT MEDICAL LEAVE APPLICATION FORM

# FOR ACADEMIC ACTIVITIES

01 Name : ~~Mr~~/Miss: ..........................................................................

..........................................................................

02 Registration No: .......................................... 03 Batch:...................................

04 Period of medical leave: From:............................ To:.....................................

05 Academic activity/activities,missed during above period

| | Department/s | Lectures | Practical | Tutorials | Clinical | In Course assessment |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

Have you submitted a medical certificate for an examination before : ~~Yes~~ /No

If yes, please specify :..........................................................................................................

..........................................................................................................

I certify above information is correct.

Date:...................................... ..........................................
Signature

**This form should accompany a duly signed medical certificate within 07 days of commencing your leave.**

රුහුණ විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර ශිෂ්‍යයන් විසින් වෛද්‍ය හේතූන් මත නොපැමිණීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම සඳහා අදාල වන නිර්ණායකයන්:

1. වෛද්‍ය හේතූන් මත උපාධි පරීක්ෂණ වලට පෙනී නොසිටීම.

වෛද්‍ය හේතූන් මත විභාග වලට පෙනී නොසිටීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් විධිවිධාන අනුගමනය කල යුතුය.

1.1 ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරී හෝ රජයේ ආරෝග්‍යශාලාවකින් හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික විය යුතුය.

1.2 ඉහත සියළු වෛද්‍ය සහතික රජයේ ආකෘති පත්‍රයක/ලිපි ශීර්ෂ සහිතව නිල මුද්‍රාවක් සහිතව නිකුත් කරන ලද ඒවාමත් වෛද්‍ය සහතික විය යුතුය.

1.3. ඉදිරිපත් කරනු ලබන එක් වෛද්‍ය සහතිකයක් උපරිම දින 14 ක් දක්වා පමණක් ඉදිරිපත් කල යුතු අතර වෛද්‍ය හේතූන් මත තවදුරටත් නිවාඩු අවශ්‍ය වන්නේ නම් නැවතත් ඒවාමත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

1.4. වෛද්‍ය හේතූන් මත යම් ශිෂ්‍යයෙකුට විභාගය සඳහා පෙනී සිටීමට නොහැකි වන්නේ නම් ඒ බව වහාම විදුලි පුවතක් මගින් අදාල පීඨයේ පීඨාධිපතිට/ලේඛකාධිකාරිට/අදාල පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී හෝ සහකාර ලේඛකාධිකාරී වෙත දැන්විය යුතුය. හැකි ඉක්මනින් අදාල වෛද්‍ය සහතික ඉදිරිපත් කලයුතු අතර එම කාලය වෛද්‍ය නිවාඩු ආසන්නව පීඨයට වාර්තා කල දින සිට සතියක් නොඉක්මවිය යුතුය.

2. දේශන වලට නොපැමිණීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම.

යම් ශිෂ්‍යයෙකුට වෛද්‍ය හේතූන් මත දේශන වලට සහභාගී වීමට නොහැකිවීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් නිර්ණායක අනුගමනය කල යුතුය.

2.1 දින 5 ක් නොඉක්මවන කාලයක් සඳහා වෛද්‍ය හේතූන් මත දේශන වලට සහභාගී වීමට නොහැකි වීම පිළිබඳව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී ඉහත 1.1 උප වගන්තියෙහි සඳහන් වෛද්‍ය නිළධාරීන් හැරුණු විට වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරියෙකු (MBBS උපාධිධාරී) හෝ ලියාපදිංචි ආයුර්වේද නිලධාරීවරයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

2.2. දේශනවලට සහභාගී නොවීම සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික සඳහා ද 1.2 සිට 1.4 දක්වා වන උප වගන්ති වල නිර්ණායකයන් අදාල වන අතර එම නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියා කල යුතුය.

3. වෛද්‍ය හේතූන් මත විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීම.

වෛද්‍ය හේතූන් මත විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීම සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේ දී පහත නිර්ණායක අනුගමනය කල යුතුය.

3.1. යම් ශිෂ්‍යයෙකු වෛද්‍ය හේතූන් මත විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීම සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කරන්නේ නම් අඛණ්ඩව හෝ කඩවීම් සහිතව එම වෛද්‍ය සහතිකය මගින් අවම වශයෙන් සති 6 ක (වැඩ කරන දින 30 ක කාලයක්) කාලයක් ආවරණය විය යුතුය. ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික 1.1 උප වගන්තියේ සඳහන් වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතික විය යුතු අතර 1.2. උප වගන්තියේ සඳහන් නිර්ණායකයන් අනුව ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතිකයක් විය යුතුය.

4. වෛද්‍ය සහතික අනුමත කිරීම.

ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික අනුමත කිරීමේදී පහත ක්‍රියා පිළිවෙත අනුගමනය කල යුතුය.

4.1. නියමිත කාලය තුල දී ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික විශ්වවිද්‍යාල වෛද්‍ය නිළධාරී නොපමාව ඉදිරිපත් කර නිර්දේශ ලබා ගත යුතු අතර සියළුම වෛද්‍ය සහතික වෛද්‍ය නිර්දේශය සහිතව එළඹෙන පළමු පීඨ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අදාල තීරණය ලබා ගත යුතුය.

4.2. විශ්වවිද්‍යාල වෛද්‍ය නිළධාරී විසින් වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තීරණ ලබා ගන්නා ලෙස නිර්දේශිත වෛද්‍ය සහතික අදාළ ශිෂ්‍යයා සමග වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තීරණ ලබා ගත යුතු අතර, එම නිර්දේශයන් සඳහා පීඨ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය. 1.4 වෛද්‍ය සහතික සඳහා ලබා දෙනු ලබන තීරණ ශිෂ්‍යයාට ලිඛිතව දැනුම් දිය යුතු අතර, අදාළ තීරණයන්හි පිටපතක් එම ශිෂ්‍යයාගේ ශිෂ්‍ය පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ අංශය වෙත යැවිය යුතුය.